## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

(Recovery Plan for Learning Loss – 2022)

(11 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13 ක් ද දෙවන හා තෙවන වාර වල කාලච්ඡේද 18 ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නර්තනය

## 11 ශ්‍රේණිය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| දෙවන වාරය | | | | | |
|---|---|---|---|---|---|
| **නිපුණතාව** | **නිපුණතා මට්ටම** | **අත්‍යාවශ්‍ය ඉගෙනුම් ඵල** | **විෂය අන්තර්ගතය** | **ක්‍රියාකාරකම** | **කාලච්ඡේද** |
| 2.0<br>නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.2<br>ශිල්පීය විධික්‍රම අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | • මුසලඩි වන්නම / ශුද්ධ තාලය සින්දු වන්නම / කොවුලා වන්නමට අයත් කවි නියමිත නාදමාලාවට හා තාලයට අනුව ගායනය කරයි.<br>• මුසලඩි වන්නම / ශුද්ධ තාලය සින්දු වන්නම / කොවුලා වන්නමට අදාල පද නර්තනය කරයි.<br>• අදාල වන්නම්වල කස්තිරම / කලාසම / ඉරට්ටිය, සීරුමාරුව හා අඩව්ව නර්තනය කරයි.<br>• ගායනය කරමින් වාදනයට අනුව කණ්ඩායම් ලෙස නර්තනයේ යෙදෙයි.<br>• බෙර වාදනයට අනුව නියමිත අංගහාර සහිතව සම්පූර්ණ වන්නම නර්තනය කරයි. | (මුසලඩි වන්නම / ශුද්ධ තාලය සින්දු වන්නම / කොවුලා වන්නම)<br>සම්පූර්ණයෙන් නර්තනය කරයි | 2.2.1<br>වන්නම් සම්පූර්ණයෙන් නර්තනය කරමු. | 03 |
| 4.0<br>ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.2<br>නියමිත නාදමාලාව අනුගමනය කරමින් ගායනා ඉදිරිපත් කරයි. | • නියමිත ගායනාවල පසුබිම විස්තර කරයි.<br>• එම ගායනවල භාෂාත්මක විග්‍රහය, අනන්‍යතා ලක්ෂණ හා ගායන අවස්ථා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• නියමිත නාදමාලා අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරයි.<br>• සාමූහිකව ගායන ඉදිරිපත් කරයි.<br>• ගායන ප්‍රාසාංගිකව ඉදිරිපත් කරයි. | ජන ගායනාවල සමාජ සංස්කෘතික පසුබිම හඳුනා ගනිමින් නියමිත නාද මාලාවට අනුව ගායනය<br><br>ග්‍රහ පන්ති කවි, ප්‍රශස්ති කවි, 6-8 ශ්‍රේණි දක්වා ඉගෙනගත් වන්නම් ගායනය | 4.2<br>නියමිත නාදමාලාව අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරමු. | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1.0<br>පරිසරය නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරුකර ගනිමින් නර්තන නිර්මාණය කරයි. | 1.2<br>තේමාවක් අනුව චරිත නිරූපනය කරයි | • චරිත නිරූපණයට සුදුසු සිද්ධියක් ගොඩ නගයි.<br>• නර්තන මාධ්‍ය කොටගෙන චරිත නිරූපණය කරයි.<br>• විවිධ භාව ප්‍රකාශවන පරිදි චරිත නිරූපණයේ යෙදෙයි.<br>• තේමාවක් අනුව චරිත නිරූපණයේ යෙදෙයි. | සිද්ධියකට අනුව තේමාවක් තෝරාගෙන නර්තන මාධ්‍යයෙන් විවිධ චරිත නිරූපණය | 1.2<br>විවිධ චරිත නිරූපණය කරමු. | 03 |
| 1.0<br>පරිසරය නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරුකර ගනිමින් නර්තන නිර්මාණය කරයි. | 1.3<br>ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනාගනිමින් නර්තන නිර්මාණ කරයි. | • කඩු/ මෝල්ගස් නැටුමේ සුවිශේෂ ලක්ෂණ හඳුන්වයි.<br>• කඩු/ මෝල්ගස් නැටුමට උචිත චලන නිර්මාණය කරයි.<br>• කඩු/ මෝල්ගස් නර්තන නිර්මාණ පිළිබඳ විචාරාත්මකව අදහස් දක්වයි. | කඩු / මෝල්ගස් නැටුමක් නිර්මාණය<br>උචිත චලන නිර්මාණය<br>රංග උපකරණ නිවැරදිව හැසිරවීම<br>විචාරාත්මකව අදහස් දැක්වීම | 1.3<br>කඩු/ මෝල් ගස් නැටුමක් නිර්මාණය කරමු. | 03 |
| 2.0<br>නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි | 2.2.2<br>ශිල්පීය විධික්‍රම අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | • කුදාංත ගත දොං වට්ටම / කද ගති ගත වට්ටම / පට්ටුතල් මාත්‍රයට අදාල තිත් රූපය නම් කරයි.<br>• අදාල පද කොටස් තාල තබමින් කියයි.<br>• නිවැරදි අංගහාර අනුගමනය කරමින් කුදාංත ගත දොං වට්ටම / කද ගති ගත වට්ටම / පට්ටුතල් මාත්‍රය ප්‍රදර්ශනය කරයි. | වට්ටම නර්තනය<br>කුදාංත ගත දොං වට්ටම/ ගුඳ ගති ගත වට්ටම/ පට්ටුතල් මාත්‍රය<br>- තාල තබා කීම<br>- නිවැරදි අංගහාර සහිතව නර්තනය | 2.2<br>කුදාංත ගත දොං වට්ටම/ ගුඳ ගති ගත වට්ටම/ පට්ටුතල් මාත්‍රය නර්තන අංග ප්‍රදර්ශනය කරමු. | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3.0<br>සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3.2<br>නිවැරදි ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කරයි. | • මැදුම් මහ දෙතිතට අයත් බෙර පද තාල තබා කියයි.<br>• මැදුම් මහ දෙතිතට අයත් බෙර පද වාදනය කරයි.<br>• සාමූහිකව බෙර වාදනයේ යෙදෙයි. | මැදුම් මහ දෙතිතට අයත් බෙර පද වාදනය<br><br>8 ශ්‍රේණියේ සිට ඉගෙනගත් බෙරපද අභ්‍යාස කිරීම | 3.2<br>බෙර පද වයමු | 02 |
| 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රාදය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැකගැනීම සඳහා ක්‍රියාකරයි. | 5.1<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික පසුබිම විස්තර කරයි. | • අධ්‍යාපනික වශයෙන් ඇති වූ නව ප්‍රවණතා විස්තර කරයි.<br>• සමාජයීය අවශ්‍යතා සඳහා නර්තනය යොදා ගන්නා අයුරු සාකච්ඡා කරයි.<br>• නූතන තාක්ෂණ භාවිතය මඟින් නර්තන ප්‍රාසාංගික ව ඉස්මතු කොට දැක්විය හැකි බවට කරුණු ඉදිරිපත් කරයි.<br>• විවිධ නර්තන, නව නිර්මාණ බිහිවීම නර්තන කලාවේ ප්‍රගමනයට ඉවහල් වී ඇති බවට තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ව්‍යවහාරික නර්තන, සමාජ සංස්කෘතිය හා ආර්ථික අංග කෙරෙහි බලපාන අයුරු සාකච්ඡා කරයි. | නර්තන කලාවේ නූතන ප්‍රවණතා අධ්‍යයනය<br><br>- අතීතයේ හා වර්තමාන නර්තනයේ වෙනස්කම්<br><br>- 1970න් පසු අධ්‍යාපනයේ නව ප්‍රවණතා<br><br>- සමාජීය අවශ්‍යතා සඳහා නර්තනය<br><br>- ප්‍රාසාංගික බව සඳහා තාක්‍ෂණික භාවිතය<br><br>- ව්‍යවහාරික නර්තනය | 5.1.2<br>නර්තන කලාවේ නූතන ප්‍රවණතා අධ්‍යයනය කරමු. | 02 |
| | | | | **දෙවන වාරය කාලච්ඡේද එකතුව** | 18 |